# දැන්වීමයි.

# පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

# නැගෙනහිර පළාත

## විභාග සංචිතය සඳහා සම්පත් දායකයින් ලියාපදිංචි කිරීම - 2025

නැගෙනහිර පළාත් රාජ්‍ය සේවයට අදාල බඳවා ගැනීම්, උසස් කිරීම්, කාර්යක්ෂමතා කඩඉම් විභාග හා දෙපාර්තමේන්තු පරීක්ෂණ සඳහා ප්‍රශ්න පත්‍ර සැකසීම හා පිළිතුරු පත්‍ර ඇගයීම් ක්‍රියාවලිය විධිමත් කිරීමේ අරමුණින් ඒ සඳහා සුදුසුකම් සහිත සහ මනාපයක් දක්වන, මාණ්ඩලික නිලධාරින් ඇතුළු විෂය ප්‍රවීණයන්ගෙන් සමන්විත සම්පත් දායක සංචිතයක් පිහිටුවා ගැනීමට නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව තීරණය කර ඇත. ඒ අනුව විභාග ප්‍රශ්න පත්‍ර සැකසීම හා පිළිතුරු පත්‍ර ඇගයීම සම්බන්ධයෙන් මනා පළපුරුද්දක් සහිත දැනට රාජ්‍ය සේවයේ/ පළාත් රාජ්‍ය සේවයේ නියුතු හෝ විශ්‍රාමික නිලධරයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

අයදුම්පත් භාරගන්නා අවසාන දිනය **2025.02.28** දින වේ.

තෝරා ගනු ලබන සම්පත් දායකයින් නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කලින් කලට නිශ්චය කරනු ලබන ගාස්තු යටතේ විභාග ප්‍රශ්න පත්‍ර සැකසීම හා පිළිතුරු පත්‍ර ඇගයීම් ක්‍රියාවලිය විධිමත්ව හා පූර්ණ රහස්‍යභාවය සුරකිමින් නිසි කලට ඉටු කර දීම කළ යුතුය. එමෙන්ම අවශ්‍ය අවස්ථා වල අදාල ප්‍රශ්න පත්‍ර දෙමළ/ඉංග්‍රිසි මාධ්‍යයන්ට පරිවර්තනය කර සකස් කිරීම හා දෙමළ/ඉංග්‍රිසි මාධ්‍ය පිළිතුරු පත්‍ර ඇගයීමද පූර්ණ රහස්‍යභාවය ආරක්ෂා වන පරිදි සිදුකර දිය යුතුය. තවද, තෝරා ගනු ලබන සම්පත් දායකයින් තම සම්පත් දායකත්වය ලබා දීම පිණිස නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නියම කරනු ලබන කොන්දේසි වලට අදාලව ගිවිසුමකට එළඹිය යුතුය.

ඒ අනුව මෙම සංචිතයට ඔබගේ දායකත්වය සැපයීමට අදහස් කරන්නේ නම්, පහත සඳහන් නැගෙනහිර පළාත් සභා වෙබ් අඩවියට පිවිස වැඩි විස්තර හා සුදුසුකම් පරීක්ෂා කර, ආදර්ශ අයදුම්පතට අනුව අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් යොමු කරන ලෙස කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ. අයදුම්පත්‍රය සමග ඔබගේ සුදුසුකම් සනාථ කිරීමට අදාල ලිපි ලේඛන වල සහතික කළ පිටපත් ද අමුණා එවිය යුතුවේ. ලිපි කවරයේ වම් පස ඉහළ කෙලවරේ **"සම්පත් දායකයින් ලියාපදිංචි කිරීම (විභාග) - 2025"** යනුවෙන් සඳහන් කරන මෙන් ද වැඩිදුරටත් දන්වා සිටිමි.

තවද විභාග ප්‍රශ්න පත්‍ර සැකසීම සහ පිළිතුරු පත්‍ර ඇගයීම් ක්‍රමවේදය වඩාත් විධිමත් අයුරින් සිදුකිරීම සඳහා මෙම ක්‍රියාවලියේ පූර්ණ රහස්‍යභාවය සුරැකීමේ සහ කඩිනමින් ක්‍රියාකිරීමේ ඇති අවශ්‍යතාවයද අවධාරණය කරමි.

***www.ep.gov.lk → Exams & Results → Special Notices***

**ජේ. ලියාකත් අලි,**
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
නැගෙනහිර පළාත.

**2025.02.03**